# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2193/52 - 2020 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2020.09.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

2020.01 .01 සිට 2020.12.31 දක්වා ආදායම් වියදම් ඇස්තමේන්තුව

**1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය යටතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අවසරය පරිදි පළාත් සභා අරමුදලින් වියදම් දැරීම සඳහා සකස් කරන ලදී.**

***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හයවන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අවසර දීම***

2020 වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා වසරක සේවා වියදම සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා සබරගමුව පළාත තුළ ණය ලබා ගැනීමට බලය දීමත්, එම කාලය තුළ සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් වියදම් සඳහා ඒ කාලය තුළ අවශ්‍ය වන මුදල් සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, සබරගමුව පළාත් සභා අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට අනුශාංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ නියෝගයකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ ආණ්ඩුකාරයා වන මා විසින් මෙසේ පනවනු ලැබේ.

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය (6) වන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2020 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වසරක කාල සීමාව සඳහා සබරගමුව පළාත් සභාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රු. මිලියන තිස්තුන් දහස් හයසිය හැට හයකුත් එකසිය අසූදෙදහසක් (රු. 33,666,182,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන්දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි. — අවසරය ලබා දීම

2. යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ නියෝගයෙහි "වසරක" යනුවෙන් සඳහන් කරනු ලබන, 2020 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භව 2020 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රු. මිලියන තිස්තුන් දහස් හයසිය හැට හයකුත් එකසිය අසූදෙදහසක් (රු. 33,666,182,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් :- — 2020 වර්ෂය සඳහා විසර්ජන

(අ) සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීම සඳහා මෙයින් බලය දෙනු බලන ගෙවීම් වලින් හා

(ආ) සබරගමුව පළාත තුළ ණය වශයෙන් ලබා ගන්නා මුදල් වලින් හෝ සබරගමුව පළාත් සභාව සඳහා ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල් වලින් පියවිය යුතුය. මෙහි ඉහත සඳහන් කළ රු. මිලියන තිස්තුන් දහස් හයසිය හැට හයකුත් එකසිය අසූදෙදහසක් (රු. 33,666,182,000) වූ මුදල මේ නියෝගයේ පළමුවන උප ලේඛනයේ නියමිති පරිදි වැය කළ හැකිය.

2. මේ වගන්තියේ (I) වන උපවගන්තියෙහි විධිවිධාන සබරගමුව පළාත් සභාව සඳහා හා එය වෙනුවෙන් ණය ලබාගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියකට විධිවිධානවලට හානියක් නොමැතිව බලපැවැත්විය යුතුය.

2020 වර්ෂය සඳහා සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීම

3. (1) 2020 මුදල් වර්ෂයක කාල සීමාව තුළදී, මේ නියෝගයේ දෙවන උපලේඛනයේ IV වන තීරුවේ සඳහන් එක් එක් කටයුත්තෙන් සබරගමුව පළාත් සභාවට ලැබෙන VI වන තීරුවෙහි සඳහන් ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්තය, VI තීරුවෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතුය.

4. මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 2020 මුදල් වර්ෂයේ සබරගමුව පළාත් සභාව විසින් කරනු ලබන වියදම්, ඒ කාලය තුළදී එම කටයුත්තෙන් සබරගමුව පළාත් සභාව ලබන ලැබීම්වලින් ගෙවිය යුතුය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ V වන තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

5. මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 2020 වර්ෂයේ අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ VII තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතුය. තවද, එම කාලය අවසානයේදී එම කටයුත්තේ මුළු බැරකම් VIII වන තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

2020 වර්ෂය තුළදී 3 වන වගන්තියේ සඳහන් කටයුතු පිළිබඳ වියදම් සඳහා සබරගමුව පළාත් සභා අරමුදෙලන් හෝ මුදල් වලින් අත්තිකාරම් ගෙවීම

6. 2020 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ නියෝගයේ දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන යම් කටයුත්තකින් සබරගමුව පළාත් සභාවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන්, සබරගමුව පළාත් සභාව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා යයි ආණ්ඩුකාරවරයා සලකන මුදල් සබරගමුව පළාත් අරමුදලෙන් හෝ මුදල් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල් වල සමස්තය එම උපලේඛනයේ පස්වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, මා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට සබරගමුව පළාත් සභා අරමුදලට ආපසු ගෙවිය යුතුය.

වැඩසටහන පුනරාවර්තන වියදම් සඳහා වෙන් කරන ලද නමුත් වියදම් නොකරන ලද මුදල් ඒ වැඩ සටහනේම වෙනත් වෙන් කිරීමකට හෝ ඒ වැය ශීර්ෂය යටතේම වූ වෙනත් වැඩසටහනකට හෝ මාරු කිරීමේ බලය

7. (1) මේ නියෝගයෙහි පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට එම උප ලේඛනයේ විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබූවා වූද, එහෙත් වියදම් නොකර ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු වියහැකි වූද යම් මුදලක්, එම වැඩසටහනේම මූලධන වියදම් වශයෙන් හෝ වෙනත් වැඩසටහනක පුනරාවර්තන හෝ මූලධන වියදම් වශයෙන් හෝ වෙන් කිරීමට හෝ ප්‍රධාන ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධාරියකුගේ හෝ නියමට අනුව මාරු කළ හැකිය.

(2) මේ නියෝගයෙහි පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයන් යටතේ දැක්වෙන මූලධන වියදමට වෙන් කරන ලද මුදලක් ඒ ශීර්ෂයේ වැඩසටහනෙන් හෝ ව්‍යාපෘතියෙන් පිටතට මාරු කිරීම ප්‍රධාන ලේකම්වරයාට පමණක්ම කළ හැකිය.

8. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු විය හැකි බවට; හෝ

(2) යම්කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල තවදුරටත් අවශ්‍ය නොවන බවට ආණ්ඩුකාරවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ මුදල් වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදාහරින ලද මුදල් සම්පූර්ණයෙන්ම හෝ ඉවත් කර ගැනීම, ආණ්ඩුකාරවරයා විසින් කරනු ලැබිය හැකිය.

මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ දැක්වෙන උපරිම හා අවම සීමා වෙනස් කිරීමට ආණ්ඩුකාරවරයාට ඇති බලය

9. ආණ්ඩුකාරවරයා විසින් :-

(අ) මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ V වන තීරයෙහි, VII වන තීරයෙහි සහ VIII තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක්

(ආ) මේ නියෝගයෙහි දෙවන උපලේඛනයේ VI වන තීරයෙහි දැක්වෙන අවම සීමා :

නියමයන් මගින් 2021 මැයි මස 31 දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, ආණ්ඩුකාරවරයා විසින් ඍය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතුය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයකද, ඒ දිනට පෙරතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතවම සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැලකිය යුතුය.

10. ආණ්ඩුකාරවරයා විසින්, ලිඛිත නියෝගයක් මගින්, මේ නියෝගයෙහි දෙවන උපලේඛනයෙහි උචිත තීරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ :-

(අ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියළුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්,

(ආ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

11. මෙම අවසරය සබරගමුව පළාතේ හත් (7) වන පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි සිට හෝ මාස තුන (03)ක කාලසීමාවන් ඉකුත් වන දිනය හෝ 2020 දෙසැම්බර් මස 31 වන දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේය.

**ටිකිරි කොබ්බැකඩුව,**
ගරු ආණ්ඩුකාරවර - සබරගමුව පළාත.

2020 අගෝස්තු මස 20 වැනි දින.

**පළමුවන උපලේඛනය**

**පළාත් සහා පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්**

**ශීර්ෂ 800 සිට 861 දක්වා**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | **30,072,912,000** |
| ප්‍රාග්ධන වියදම් | **3,593,270,000** |
| එකතුව | **33,666,182,000** |

| *ශීර්ෂය* | *ආයතන හා වැඩසටහන* | *පුනරාවර්තන වියදම රුපියල්* | *ප්‍රාග්ධන වියදම රුපියල්* |
|---|---|---|---|
| 800 | ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 64,223,250 | 4,103,000 |
| 801 | පළාත් සභා ලේකම් කාර්යාලය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 40,503,500 | 500,000 |
| 802 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 18,833,000 | 1,300,000 |

| ශීර්ෂය | ආයතන හා වැඩසටහන | පුනරාවර්තන වියදම රුපියල් | ප්‍රාග්ධන වියදම රුපියල් |
|---|---|---|---|
| 803 | සමුපකාර සේවක කොමිෂන් සභා කාර්යාලය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 10,775,000 | - |
| 804 | ප්‍රධාන ලේකම් | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 210,090,100 | 171,597,000 |
| 805 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 28,978,000 | - |
| 806 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය කළමනාකරණ) | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 45,414,750 | - |
| 807 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 52,284,800 | - |
| 808 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | | |
| | 50 වැනි වැඩසටහන - ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 279,453,000 | - |
| 809 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 68,562,000 | - |
| 810 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත්පරිපාලනය | 100,323,000 | 5,000,000 |
| | 47 වැනි වැඩසටහන - ප්‍රවාහන සේවා | 24,332,000 | 3,500,000 |
| | 49 වැනි වැඩසටහන - විදුලිබල හා බලශක්ති සේවා | | 32,800,000 |
| | 53 වැනි වැඩසටහන - සමුපකාර සංවර්ධනය | | - |
| | 60 වැනි වැඩසටහන - ප්‍රජා සංවර්ධනය | | 330,020,000 |
| | 61 වැනි වැඩසටහන - නිවාස හා ප්‍රජා පහසුකම් | 2,354,500 | 14,000,000 |
| | 63 වැනි වැඩසටහන - වැව්ලි යටිතල පහසුකම් හා වතු නිවාස | | 6,400,000 |
| | 71 වැනි වැඩසටහන - රෝහල් සේවාවන් | | 257,050,000 |
| | 72 වැනි වැඩසටහන - මහජන සෞඛ්‍ය සේවාවන් | | 61,030,000 |
| | 73 වැනි වැඩසටහන - දේශීය වෛද්‍ය සේවාවන් | | 40,200,000 |
| | 93 වැනි වැඩසටහන - ආගමික හා සංස්කෘතික කටයුතු | | 2,000,000 |
| | 96 වැනි වැඩසටහන - කාන්තා සංවර්ධනය | | 1,000,000 |
| 811 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 223,621,700 | |
| | 71 වැනි වැඩසටහන - රෝහල් සේවාවන් | 6,948,150,400 | |
| | 72 වැනි වැඩසටහන - මහජන සෞඛ්‍ය සේවාවන් | 1,352,649,800 | |
| 812 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | | |
| | 73 වැනි වැඩසටහන - දේශීය වෛද්‍ය සේවාවන් | 528,594,800 | |
| 813 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | 53 වැනි වැඩසටහන - සමුපකාර සංවර්ධනය | 104,481,500 | |

| ශීර්ෂය | ආයතන හා වැඩසටහන | පුනරාවර්තන වියදම රුපියල් | ප්‍රාග්ධන වියදම රුපියල් |
|---|---|---|---|
| 814 | පළාත් පාලන දෙපාර්තමේන්තුව | | |
| | 60 වැනි වැඩසටහන - ප්‍රජා සංවර්ධනය | 2,171,427,800 | |
| 820 | පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 43,040,650 | - |
| | 50 වැනි වැඩසටහන - ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 567,000,000 | 112,500,000 |
| | 52 වැනි වැඩසටහන - ප්‍රාදේශීය සංවර්ධනය | | 105,300,000 |
| | 90 වැනි වැඩසටහන - විනෝද කටයුතු හා ක්‍රීඩා | | 86,200,000 |
| 821 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | 90 වැනි වැඩසටහන - විනෝද කටයුතු හා ක්‍රීඩා | 50,833,300 | |
| 830 | සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 34,461,400 | - |
| | 51 වැනි වැඩසටහන - කර්මාන්ත සංවර්ධනය | | 34,767,000 |
| | 60 වැනි වැඩසටහන - ප්‍රජා සංවර්ධනය | 33,579,500 | 60,230,000 |
| | 95 වැනි වැඩසටහන - සමාජ ආරක්ෂණය | | 57,003,000 |
| 831 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | 51 වැනි වැඩසටහන - කර්මාන්ත සංවර්ධනය | 141,472,300 | |
| 832 | පරිවාස, ළමාරක්ෂක හා සමාජසේවා දෙපාර්තමේන්තුව | | |
| | 95 වැනි වැඩසටහන - සමාජ ආරක්ෂණය | 353,443,200 | |
| 840 | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | | |
| | 3 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 79,044,450 | 1,701,770,000 |
| | 80 වැනි වැඩසටහන - ප්‍රාථමික අධ්‍යාපනය | | 56,200,000 |
| | 81 වැනි වැඩසටහන - ද්විතියික අධ්‍යාපනය | | 242,800,000 |
| | 93 වැනි වැඩසටහන - ආගමික හා සංස්කෘතික කටයුතු | 9,683,500 | 13,000,000 |
| 841 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 585,683,600 | |
| | 80 වැනි වැඩසටහන - ප්‍රාථමික අධ්‍යාපනය | 5,312,540,700 | |
| | 81 වැනි වැඩසටහන - ද්විතියික අධ්‍යාපනය | 9,907,628,550 | |
| | 87 වැනි වැඩසටහන - අධ්‍යාපන සහභාගීත්වය වැඩිදියුණු කිරීම | 20,995,700 | |
| | 88 වැනි වැඩසටහන - අධ්‍යාපන සැලසුම්කරණය පාලනය හා සේවා සැපයීම | 10,967,750 | |

| ශීර්ෂය | ආයතන හා වැඩසටහන | පුනරාවර්තන වියදම රුපියල් | ප්‍රාග්ධන වියදම රුපියල් |
|---|---|---|---|
| 850 | ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 32,680,800 | 39,000,000 |
| | 40 වැනි වැඩසටහන - ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | | 5,500,000 |
| | 43 වැනි වැඩසටහන - වාරිමාර්ග හා ජල කළමනාකරණය | | 40,500,000 |
| | 44 වැනි වැඩසටහන - කෘෂිකාර්මික සංවර්ධනය | | 56,000,000 |
| | 45 වැනි වැඩසටහන - පශු සම්පත් සංවර්ධනය | | 42,000,000 |
| | 55 වැනි වැඩසටහන - ආහාර සුරක්ෂිතතාව පවත්වාගැනීම | | 10,000,000 |
| 851 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | |
| | 40 වැනි වැඩසටහන - ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | 63,070,500 | |
| 852 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | |
| | 44 වැනි වැඩසටහන - කෘෂිකාර්මික සංවර්ධනය | 266,716,700 | |
| 853 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | 45 වැනි වැඩසටහන - පශු සම්පත් සංවර්ධනය | 263,907,500 | |
| 861 | පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 21,109,000 | |
| | | **30,072,912,000** | **3,593,270,000** |

**දෙවන උපලේඛනය**

**2020 - ඇස්තමේන්තු**
**2020 - Estimates**

**අත්තිකාරම් ගිණුම් කටයුතු**
**Advanced Account Activities**

| *i* | *ii* | *iii* | *iv* | *v* | *vi* | *vii* | *viii* |
|---|---|---|---|---|---|---|---|
| | *අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු Ministry/ Department* | *විෂය අංකය Code No.* | *අත්තිකාරම් වර්ගය Category of Advance* | *උපරිම වියදම් සීමාව Maximum limit of expenditure* | *අවම ලැබීම් සීමාව Minimum limit of Receipt* | *හර ශේෂයේ උපරිම සීමාව Maximum limit of debit balance* | *බැරකම්වල උපරිම සීමාව Maximum limit of liabilities* |
| | | | **මුළු එකතුව Grand Total** | **2,045,350,000** | **739,869,000** | **4,921,080,999** | **4,250,000** |
| | *පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම Provincial Public Officers* | | උප එකතුව Sub total | 1,899,400,000 | 675,329,000 | 4,872,840,999 | - |
| 1 | ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය Hon. Governor's Office | 80001 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 2,000,000 | 583,000 | 7,410,000 | - |
| 2 | පළාත් සභා ලේකම් කාර්යාලය Office of Provincial Council Secretariat | 80101 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 2,000,000 | 666,000 | 7,381,000 | - |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | *අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු Ministry/ Department* | *විෂය අංකය Code No.* | *අත්තිකාරම් වර්ගය Category of Advance* | *උපරිම වියදම් සීමාව Maximum limit of expenditure* | *අවම ලැබීම් සීමාව Minimum limit of Receipt* | *හර ශේෂයේ උපරිම සීමාව Maximum limit of debit balance* | *බැරකම්වල උපරිම සීමාව Maximum limit of liabilities* |
| 3 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය Office of Provincial Public Service Commission | 80201 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 1,400,000 | 666,000 | 5,321,000 | - |
| 4 | සමුපකාර සේවා කොමිෂන් සභා කාර්යාලය Office of Co-operative Employees Commission | 80301 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 1,000,000 | 416,000 | 3,728,000 | - |
| 5 | ප්‍රධාන ලේකම් Chief Secretary | 80401 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 30,000,000 | 11,666,000 | 85,334,000 | - |
| 6 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) Deputy Chief Secretary (Planning) | 80701 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 5,000,000 | 2,000,000 | 11,903,000 | - |
| 7 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) Deputy Chief Secretary (Engineering Services) | 80801 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 25,000,000 | 9,166,000 | 69,834,000 | - |
| 8 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව Provincial Revenue Department | 80901 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 5,000,000 | 2,083,000 | 15,417,00 | |
| 9 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය Ministry of Law & Order, Finance & Planning, Local Government, Health, Indigeneous Medicine, Women Affairs, Co-operatives, Trade & Food, Transport, Estate Welfare, Environment, News, Housing & Construction & Religious Affairs. | 81001 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 9,300,000 | 4,660,000 | 30,834,000 | - |
| 10 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව Department of Health | 81101 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 370,000,000 | 123,333,000 | 1,250,278,000 | - |
| 11 | ආයුර්වේද දෙපාර්තමේන්තුව Department of Indigenous Medicine | 81201 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 28,000,000 | 12,500,000 | 77,500,000 | - |
| 12 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව Department of Co-operative Development | 81301 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 9,000,000 | 3,750,000 | 23,150,000 | - |
| 13 | පළාත් පාලන දෙපාර්තමේන්තුව Department of Local Government | 81401 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 5,500,000 | 2,500,000 | 19,500,000 | - |
| 14 | පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය Ministry of Provincial Road .Development, Road infrastructure facilities, Tourism, and Sports and Youth affairs | 82001 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 2,700,000 | 1,083,000 | 8,717,000 | - |
| 15 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව Department of Sports Development | 83101 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 2,000,000 | 500,000 | 5,600,000 | - |

| *i* | *ii* | *iii* | *iv* | *v* | *vi* | *vii* | *viii* |
|---|---|---|---|---|---|---|---|
| | *අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු* *Ministry/ Department* | *විෂය අංකය* *Code No.* | *අත්තිකාරම් වර්ගය* *Category of Advance* | *උපරිම වියදම් සීමාව* *Maximum limit of expenditure* | *අවම ලැබීම් සීමාව* *Minimum limit of Receipt* | *හර ශේෂයේ උපරිම සීමාව* *Maximum limit of debit balance* | *බැරකම්වල උපරිම සීමාව* *Maximum limit of liabilities* |
| 16 | සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය Ministry of Social Welfare, Probation and Childcare, Rural Development and Rural Industries | 83001 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 10,500,000 | 4,125,000 | 29,417,000 | - |
| 17 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව Department of Industrial Development | 83101 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 12,000,000 | 5,583,000 | 34,117,000 | - |
| 18 | පරිවාස, ළමාරක්ෂක හා සමාජසේවා දෙපාර්තමේන්තුව Department of Probation, Childcare & Social Services | 83201 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 11,000,000 | 3,750,000 | 31,750,000 | - |
| 19 | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය Ministry of Education, Information Technology & Cultural Affairs | 84001 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 12,000,000 | 2,800,000 | 33,700,000 | - |
| 20 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව Department of Education | 84101 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 1,300,000,000 | 458,333,000 | 2,991,666,666 | - |
| 21 | ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය Ministry of Land, Provincial Irrigation, Agriculture, Animal Production, Animal Health and Fisheries | 85001 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 2,500,000 | 1,250,000 | 14,250,000 | - |
| 22 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව Department of Land Commissioner | 85101 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 6,500,000 | 3,333,000 | 16,666,666 | - |
| 23 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව Department of Agriculture | 85201 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 30,000,000 | 12,500,000 | 64,500,000 | - |
| 24 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව Department of Animal Production and Health | 85301 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 15,000,000 | 7,083,000 | 28,416,667 | - |
| 25 | පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව Department of Provincial Internal Audit | 86101 | පළාත් රා.නි. අත්තිකාරම් Provincial P.O. Advance | 2,000,000 | 1,000,000 | 6,450,000 | - |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු<br>*Ministry/ Department* | විෂය අංකය<br>*Code No.* | අත්තිකාරම් වර්ගය<br>*Category of Advance* | උපරිම වියදම් සීමාව<br>*Maximum limit of expenditure* | අවම ලැබීම් සීමාව<br>*Minimum limit of Receipt* | හර ශේෂයේ උපරිම සීමාව<br>*Maximum limit of debit balance* | බැරකම්වල උපරිම සීමාව<br>*Maximum limit of liabilities* |
| | වෙනත් අත්තිකාරම් ගිණුම<br>***Other Advance Accounts*** | | උප එකතුව<br>***Sub Total*** | 145,950,000 | 64,540,000 | 48,240,000 | 4,250,000 |
| 26 | පළාත් සභා ලේකම් කාර්යාලය<br>Provincial Council Secretariat | 80102 | මන්ත්‍රීවරුන්ට විවිධ අත්තිකාරම්<br>Miscellaneous advance for Council Members | 26,400,000 | 2,100,000 | 24,000,000 | - |
| 27 | කළමනාකරණ හා සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය - පුස්සැල්ල<br>Management Development & Training Cerntre, Pussella | 80502 | පුහුණු මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම්<br>Training Centre advance accounts | 11,000,000 | 9,500,000 | 2,000,000 | 50,000 |
| 28 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Law & Order, Finance & Planning, Local Government, Health, Indigeneous Medicine, Womens Affairs, Co-operative, Trade & Food, Transport, Estate Welfare, Environment, Media, Housing & Construction & Religious Affairs. | 81002 | පරිගණක ව්‍යාපෘතිය<br>Computer Project | 1,750,000 | 140,000 | 300,000 | 100,000 |
| 29 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Law & Order, Finance & Planning, Local Government, Health, Indigeneous Medicine, Womens Affairs, Co-operative, Trade & Food, Transport, Estate Welfare, Environment, Media, Housing & Construction & Religious Affairs. | 81003 | පින්නවල ඉපැරණි තේමා උද්‍යානය | 8,500,000 | 3,000,000 | 300,000 | 800,000 |
| 30 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති, නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Law & Order, Finance & Planning, Local Government, Health, Indigeneous Medicine, Womens Affairs, Co-operative, Trade & Food, Transport, Estate Welfare, Environment, Media, Housing & Construction & Religious Affairs. | 81004 | සබරගමුව පළාත් රංගශාලා අත්තිකාරම් ගිණුම | 4,000,000 | 2,000,000 | 200,000 | 200,000 |

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු *Ministry/ Department* | විෂය අංකය *Code No.* | අත්තිකාරම් වර්ගය *Category of Advance* | උපරිම වියදම් සීමාව *Maximum limit of expenditure* | අවම ලැබීම් සීමාව *Minimum limit of Receipt* | හර ශේෂයේ උපරිම සීමාව *Maximum limit of debit balance* | බැරකම්වල උපරිම සීමාව *Maximum limit of liabilities* |
| 31 | ආයුර්වේද දෙපාර්තමේන්තුව Department of Indigenous Medicine | 81202 | පින්නවල පංචකර්ම මධ්‍යස්ථානය, Panchakarma Centre, Pinnawala | 2,800,000 | 800,000 | 940,000 | 400,000 |
| 32 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව Department of Industrial Development | 83102 | පේෂකර්ම වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය Establishment of Textile Industrial Workshops and Management | 52,000,000 | 20,000,000 | 10,000,000 | 1,000,000 |
| 33 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව Department of Industrial Development | 83103 | කුඩා කර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය Establishment of small Industrial workshops and Management | 9,500,000 | 8,000,000 | 8,000,000 | 1,000,000 |
| 34 | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය Ministry of Education, Information Technology & Cultural Affairs | 84002 | මෙනේරිපිටිය - අටළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම Meneripitiya-Atalugama Education Development Centre | 14,000,000 | 9,000,000 | 2,000,000 | 500,000 |
| 35 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව Department of Animal Producation and Health | 85302 | උඩුගොඩ සත්ත්ව පාලන සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම Animal Husbandry Development and Training Centre | 16,000,000 | 10,000,000 | 500,000 | 200,000 |

**අධිකාරී බලය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය (6) වන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2020 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වසරක කාල සීමාව තුළ සබරගමුව පළාත් සභාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රු. මිලියන තිස්තුන් දහස් හයසිය හැට හයකුත් එකසිය අසූදෙදහසක් (රු. 33,666,182,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන් දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි.

මෙම අවසරය සබරගමුව පළාතේ හත්වන (7 වන) පළාත් සභාවේ රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) කාලසීමාවක් ඉකුත් වන දිනය හෝ 2020 දෙසැම්බර් මස 31 වන දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේය.

2020 වර්ෂයේ මුල් මාස 08 සඳහා සේවා වියදම් දැරීමට සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020 මැයි 28 දිනැතිව බලය ලබාදෙන ලද මුදලක් 2020 සැප්තැම්බර් 01 වන දින සිට දෙසැම්බර් 31 දක්වා වියදම් දැරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණයත් 2020 වර්ෂයේ අපේක්ෂිත ආදායම සහ 2020 පළමුවන පරිපූරක ඇස්තමේන්තුවක් පදනම් කරගෙන මෙම ඇස්තමේන්තුව පිළියෙළ කර ඇත.

තවද මවිසින් 2020 වර්ෂයේ මුල් මාස අටෙහි වියදම් දැරීම පිණිස 2020 මැයි මස 28 දිනැතිව අවසර දෙනු ලැබූ ආදායම් වියදම් ඇස්තමේන්තුව සහ 2020 අගෝස්තු 19 දිනැතිව අවසර දෙනු ලැබූ 2020 පළමුවන පරිපූරක ඇස්තමේන්තුවෙන් දරනු ලැබූ වියදම් ද මෙම අවසරය මත වෙන් කර දී ඇති ප්‍රතිපාදන වලින් ආවරණය කරගත යුතු බව අවධාරණය කරමි.

**ටිකිරි කොබ්බෑකඩුව,**
ගරු ආණ්ඩුකාරවර - සබරගමුව පළාත.

2020 අගෝස්තු 29 වෙනි දින

**අධිකාරී බලය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය (6) වන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2020 ජනවාරි මස 01 දිනෙන් ආරම්භව 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වසරක කාල සීමාව තුළ සබරගමුව පළාත් සභාවේ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති මෙහි දෙවන (II) උපලේඛනයේ වියදම් සබරගමුව පළාත් සභා අරමුදලෙන් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන් දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි.

මෙම අවසරය සබරගමුව පළාතේ හත්වන (7 වන) පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) කාලසීමාවක් ඉකුත් වන දිනය හෝ 2020 දෙසැම්බර් මස 31 වන දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේය.

**ටිකිරි කොබ්බෑකඩුව,**
ගරු ආණ්ඩුකාරවර - සබරගමුව පළාත.

2020 අගෝස්තු මස 29 වෙනි දින

10 - 138

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.